කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය- 2018/2019

SOC 1202 – මනෝ විද්‍යාවේ මූලිකාංග

පැ දෙකයි (02)

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

---

1. **එක්කෝ**

මනෝ විද්‍යාවේ චර්යාවාදී පර්යාලෝකය තුළින් චර්යාව අධ්‍යයනය කරන්නේ කෙසේද? පරීක්ෂණවල සොයාගැනීම් වලින් උදාහරණ සපයමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

පර්යන්ත සහ මධ්‍ය ස්නායු පද්ධති විස්තර කර ඒවාහි කෘත්‍යයන් පැහැදිලි කරන්න.

2. මනෝ විද්‍යා සම්පරීක්ෂණ වලදී භාවිත වන විධික්‍රම සහ ශිල්පක්‍රම අතර වෙනස්කම් විස්තර කර එයින් ඕනෑම දෙකක් භාවිතයෙන් එහි ශක්තීන් හා දුර්වලතා උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

3. "ඉගෙනීම යනු අත්දැකීම් තුළින් ගොඩ නගන සාපේක්ෂ වශයෙන් ස්ථාවර වූ චර්යාමය වෙනසකි" ඉගෙනීම පිළිබඳ න්‍යායික රාමු දෙකක් ඇසුරින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

4. 'චර්යාව ශක්තිමත් කරන සහ යොමු කරන ක්‍රියාවලිය ලෙස අභිප්‍රේරණය යන්න සාමාන්‍යයෙන් අර්ථ දැක්වේ.' මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය පිළිබඳ න්‍යාය භාවිත කරමින් පැහැදිලි කරන්න.

5. 'චිත්තවේග යන සංකල්පය කෙටියෙන් හඳුන්වා, චිත්තවේගයක ප්‍රධාන මූලිකාංග උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

අ.පි.බ.

6. පෞරුෂ සංවර්ධනය කෙරෙහි ෆොයිඩ්ගේ මනෝ ලිංගික අවධීන්හි බලපෑම පැහැදිලි කරන්න.

7. 'මනුෂ්‍යයන්, පරිසරය වටහා ගැනීමට යොදා ගන්නා සංකීර්ණ ක්‍රියාවලියේ මූලිකාංග වශයෙන් සංවේදනය සහ සංජානනය සැලකිය හැකිය.' ඉහත ප්‍රකාශය උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

8. මතකය සහ අමතකවීම සම්බන්ධ මානසික ක්‍රියාවලිය පුද්ගලයාගේ සමාජීය යහපැවැත්ම කෙරෙහි බලපෑම් කරයි.' ඔබ ඉගෙනගත් න්‍යායික අදහස් ඇසුරින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

**************